කාර්යාලය
அலுவலகம்
Office: 011-2186055

ලේකම්
செயலாளர்
Secretary: 011-2186057

ෆැක්ස්
பெகஸ
Fax: 011-2187249

# කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය
## மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சு
## MINISTRY OF WOMEN AND CHILD AFFAIRS

ඊමේල්/ மின்னஞ்சல /Email: secycdwe@sltnet.lk
වෙබ් අඩවිය/இணையத்தளம்/ Website: WWW.childwomenmin.gov.lk

මගේ අංකය
எனது இல
My No. MWCA/2/5/13/47/Pro/Post/2018

ඔබේ අංකය.
உமது இல.
Your No.

දිනය.
திகதி.
Date 2018.01. 17

---

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ සියළුම ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා,

මුල් ළමාවිය සංවර්ධන සහකාර
උපදේශන නිලධාරී
උපදේශන සහකාර
සහන සොයුරි
වනිතා සංවර්ධන නිලධාරී

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2018**

**රජයේ හා පළාත් සභාවල ක්ෂේත්‍ර නිලධාරීන් ස්වකීය නිල තත්වය හා රාජකාරී හරහා පක්ෂ/අපේක්ෂක ප්‍රවර්ධන කාර්යයන්හි නිරත වීම.**

ඉහත කරුණ සම්බන්ධයෙන් සභාපති, මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද LAE/2018/4B හා 2017.12.28 දිනැති ලිපිය හා බැඳේ.(ඇමුණුම 02)

02. ඒ අනුව, ඡන්ද විමසීමේ කාල සීමාව තුළ කිසිදු නිලධාරියෙකු ඉහත ලිපියේ සඳහන් පරිදි ස්වකීය නිල තත්වය හා රාජකාරී හරහා පක්ෂ/අපේක්ෂක ප්‍රවර්ධන කාර්යයන්හි නිරත වීමෙන් වැළකී සිටින ලෙස කාරුණිකව දන්වා සිටිමි.

ඩී.එස්.විජේසේකර
අතිරේක ලේකම් (පාලන)
ලේකම් වෙනුවට

23443

ඇමුණුම 01

# කොළඹ (නාගරික) මැතිවරණ කාර්යාලය

கொழும்பு (நகர) தேர்தல்கள் அலுவலகம்

COLOMBO (CITY) ELECTIONS OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය My No. எனது இல | ඔබේ අංකය Your No. உமது இல | දිනය Date திகதி |
| CCE/LAE/18/01 | | 2018.01.01 |

කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

බස්නාහිර පළාත් සභාවේ සියලු පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්,

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ආයතන ප්‍රධානීන්,

05 JAN 2018

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම -2018**

**රජයේ හා පළාත් සභාවල ක්ෂේත්‍ර නිලධාරීන් ස්වකීය නිල තත්වය හා රාජකාරි හරහා පක්ෂ/අපේක්ෂක ප්‍රවර්ධන කාර්යයන්හි නිරතවීම.**

රජයේ හා පළාත් සභාවල ක්ෂේත්‍ර නිලධාරීන් සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ඉහත මැයෙන් යුත් අංක LAE/2018/4B හා 2017.12.28 දිනැති ලිපියේ පිටපතක් මේ සමග එවමි.

02. ඔබගේ කාරුණික අවධානය එම ලිපිය කෙරෙහි යොමු කරවන අතර ඡන්ද විමසීම් කාල සීමාව තුළ ඒ අනුව කටයුතු කරන ලෙස සියලු ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. තවද, **ඔබ යටතේ සිටින සියලු ක්ෂේත්‍ර නිලධාරීන් මේ අනුව කටයුතු කරන බවට නිසැක වීමේ වගකීම ඔබ වෙත පැවරෙන බවද කාරුණිකව සිහිපත් කරනු කැමැත්තෙමි.**

03. නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට ඔබ දක්වන සහයෝගය ඉතා අගය කරමි.

**ඩබ්. එම් . සී. කුමුදුනී විජේකුරුප්පු**
**නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්**
**කොළඹ (නාගරික)**

පිටපත:

1. මැතිවරණ කොමසාරිස් ජනරාල්/ අධ්‍යක්ෂ ජනරාල් - දැනගැනීම සඳහා


☎ : 011–287 2247 : 011–287 2248
Fax : 011–287 2248
E-MAIL : colombocity@elections.gov.lk

ලිපිනය முகவரி Address: පළමු මහළ - 395, පරණ කෝට්ටේ පාර, රාජගිරිය.
முதலாம் மாடி - 395, பழைய கோட்டே வீதி, ராஜகிரிய.
First Floor - 395, Old Kotte Road, Rajagiriya

ඇමුණුම 02

# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல்கள் ஆணைக்குழு


පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய (10107)

web : www.slelections.gov.lk e-mail : info@slelections.gov.lk


| | | |
|---|---|---|
| මගේ අංකය : **LAE/2018/4B**<br>எனது இல. | ඔබේ අංකය :<br>உமது இல. | දිනය : **2017.12.28**<br>திகதி |

(இதன் தமிழ் மொழிபெயர்ப்பு மறுபக்கத்தில் உள்ளது)

**කඩිනමින් ක්‍රියා කිරීම පිණිස**

ලේකම්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය
ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය
ලේකම්, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය
සියලුම ප්‍රධාන ලේකම්වරුන්
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් / සමෘද්ධි සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල්
සියලුම දිසාපතිවරුන්
සාමාන්‍යාධිකාරී - නිවාස සංවර්ධන අධිකාරිය

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2018**
**රජයේ හා පළාත් සභාවල ක්ෂේත්‍ර නිලධාරීන් ස්වකීය නිලතත්වය හා රාජකාරි හරහා පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධන කාර්යයන්හි නිරතවීම.**

2018 පෙබරවාරි 10 දින පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී තරග කරන පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය සඳහා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, නිවාස ඉදිකිරීම් ආධාර / ණය වාරික ලබාදීමේ විෂය භාරව ක්‍රියාකරන නිලධාරීන්, වෙනත් ක්ෂේත්‍ර කටයුතුවල නිරත සංවර්ධන නිලධාරීන් යනාදී රාජ්‍ය නිලධාරීන් අතුරින් යම් පිරිසක් සංවිධානාත්මකව ස්වකීය නිලබලය හා තනතුරේ රාජකාරි භාවිතා කරමින් සේවා ලාභීන් නැතහොත් දෙමව්පියන් කැඳවා ඒ නිලධාරීන්ට හිතැති පක්ෂ/ කණ්ඩායම්, අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීමටත් තමන් අකමැති පක්ෂ/ කණ්ඩායම්, අපේක්ෂකයන් අගතියට පත් කිරීමටත් ක්‍රියාකරන බවට පැමිණිලි ලැබෙමින් පවතී. යම් රජයේ නිලධරයෙකු හෝ නිලධාරීන් පිරිසක් ඒ අයුරින් ක්‍රියා කරන්නේ නම් එය සම්පූර්ණයෙන්ම නීති විරෝධී ක්‍රියාවක් වේ.

02. රාජකාරි වේලාව තුළ පමණක් නොව නිවාඩු ලබා සිටින අවස්ථාවක පවා ස්වකීය නිල තත්ත්වය උපයෝගී කර ගනිමින් පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂක ප්‍රවර්ධනය කිරීම හෝ අගතියට පත් කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බැවින් එවැනි නිලධාරීන් පිළිබඳව මෙම කරුණට අදාළ පැමිණිල්ලක් ලද හොත් වහාම රහස්‍ය විමර්ශනයක් කර පැමිණිල්ල සනාථ වන බව පෙනී යන්නේ නම් ඔවුන් දුර බැහැර ප්‍රදේශයකට මාරු කිරීම හෝ මුලස්ථානයේ රාජකාරි සඳහා රපෝර්තු කරන ලෙස නියම කිරීමට පියවර ගත යුතුය.

03. අදාළ වන පරිදි ඔබගේ පාලනය යටතේ සිටින ඉහත ගණයන්ට අයත් සියලුම නිලධාරීන් මේ පිළිබඳව වහාම දැනුවත් කරන ලෙස දන්වා සිටින අතර මෙම ලිපිය ලද බව හා ඒ අනුව ක්‍රියාකරන බව සනාථ කිරීම සඳහා මේ සමග ඇති ආකෘතිය සම්පූර්ණ කර ප්‍රධාන සම්බන්ධීකරණ නිලධාරී, මැතිවරණ පැමිණිලි විමර්ශන කාර්යාංශය මැතිවරණ මහලේකම් කාර්යාලය, රාජගිරිය යන ලිපිනයට 2018 ජනවාරි 08 හෝ එදිනට පෙර ලැබෙන සේ එවීමට ක්‍රියා කරන ලෙස දන්වා සිටිනු රිසියෙමි.